## තාක්ෂණික ආරම්භක ව්‍යාපාර පිබිදීම

### හැඳින්වීම

කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), තොරතුරු තාක්ෂණ කර්මාන්ත මණ්ඩලය (FITIS) හා එක්ව, තාක්ෂණික ආරම්භක ව්‍යාපාර සඳහා "තාක්ෂණික ආරම්භක ව්‍යාපාර පිබිදීම" නමින් ව්‍යාපෘතියක් සැලසුම් කර ඇත. එමඟින් ඔවුන්ගේ වර්ධන සැලසුම්, අනාගත ආයෝජකයින් වෙත ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කිරීම සිදු කරනු ඇත.

මෙම ව්‍යාපෘතියේ දී තාක්ෂණික ආරම්භකයින්ට පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ උපදේශනය ලැබෙනු ඇත.

1. ඔබේ නිෂ්පාදන සංවර්ධනය කිරීමේදී අනුගමනය කළ යුතු නිවැරදි මාර්ගය
2. ඔබේ වර්ධන සැලැස්ම පිළිබඳ උපදේශනය
3. ඔබේ ව්‍යාපාර සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය සහ ඒ සඳහා සහය දක්වන ආකාරය
4. ඔබේ ගනුදෙනුකරුවන් වෙළඳපොළට ආකර්ෂණය කර ගන්නා ආකාරය
5. අනාගත ආයෝජකයින්ට ඔබේ සැලසුම් ඉදිරිපත් කිරීමට අවශ්‍ය උපදෙස්

මෙම වැඩසටහන මඟින් කර්මාන්තයේ ප්‍රමුඛයන්ගේ අත්දැකීම්, සාර්ථක ආරම්භක ව්‍යාපාර හිමියන්ගේ අත්දැකීම් සහ ප්‍රවීණයන්ගෙන් උපදේශනය ඔබට අත් විඳිය හැකි ය.

සුදුසුකම් ලත් සහභාගිවන්නන් කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ ලියාපදිංචි වීම අවශ්‍ය වේ. ලියාපදිංචි වන ආරම්භක ව්‍යාපාර අතරින් විසිපහක් (25), ප්‍රවීණ ව්‍යාපාරිකයින්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් මඟින් මෙම වැඩසටහන සඳහා තෝරා ගනු ලැබේ.

තෝරාගත් ආරම්භක ව්‍යාපාර සඳහා පුහුණුවක් ලබා දෙන අතර අනාගත ආයෝජකයින් හමුවීමට ද අවස්ථාව ලැබෙනු ඇත.

### තෝරා ගැනීමේ නිර්ණායක

මෙම වැඩසටහන සඳහා අයදුම් කිරීමට ඔබේ ආරම්භක ව්‍යාපාරය පහත සඳහන් නිර්ණායකයන් සපුරාලිය යුතුය.

මෙම වැඩසටහන පහත සඳහන් තාක්ෂණික ක්ෂේත්‍රවල නියැලී සිටින ආරම්භක ව්‍යාපාර සඳහා පමණක් සීමා වේ.

- Enterprise Software (ව්‍යවසාය මෘදුකාංග)
- Consumer Apps (පාරිභෝගික යෙදුම්)
- AI and Machine Learning

- Data Analytics (දත්ත විශ්ලේෂණ)
- Cybersecurity (සයිබර් ආරක්ෂණය)
- Robotics and Wearables
- 3D Printing (3D මුද්‍රණය)
- AR & VR
- FinTech, EdTech, Agri Tech, Health Tech
- Gaming and Entertainment
- Blockchain
- GIS Application (GIS යෙදුම)
- IoT Applications (IoT යෙදුම්)
- POS Solutions (POS විසඳුම්)

ඉහත තාක්ෂණික ක්ෂේත්‍රවල උපාංගයක්/සේවාවක් සංවර්ධනය කිරීමේ/නිෂ්පාදනය කිරීමේ නිරතව සිටීම.

(3) නිෂ්පාදනය හෝ සේවාව දැනටමත් පරීක්ෂා කර භාවිතා කර තිබීම.
(4) නීත්‍යානුකූලව ලියාපදිංචි වී ඇති ආයතනයක් වීම.
(5) ව්‍යාපාරය එක් අවුරුද්දකට වඩා වැඩි කාලයක් පවත්වාගෙන යෑම.
(6) සේවකයින් 10 කට වඩා සිටීම.
(7) තනි හෝ බහු හිමිකාරීත්වයක් ඇති ආරම්භක ව්‍යාපාරයක් වීම.

<u>**අයදුම් කළ යුතු ආකාරය**</u>

පහත යෙදුම වෙත පිවිස ඔබගේ තොරතුරු ඇතුළත් කරන්න.

https://idb.gov.lk/tech-startup-application-form/

<u>අයදුම් භාර ගන්නා අවසාන දිනය</u>

**අයදුම් භාර ගන්නා කාලය 2024 නොවැම්බර් 25 දිනෙන් අවසන් වේ.**

**වැඩි දුර විස්තර සඳහා,**

(contact details of IDB)

ෆහීමා ජුනයිඩීන් මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු

තොරතුරු තාක්ෂණ කර්මාන්ත මණ්ඩලය
faheema@fitis.lk
074 3067671